… ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2106/35 - 2019 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2019.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/MDB/4/2/1/64/06.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : L03J/95/FR/178.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460) වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*(නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම්) :*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසියපත්තුව දකුණ කෝරළේ සුළු කොට්ඨාසයේ රඹුක්පොත (807) ග්‍රාම නිලධාරී වසමේ රඹුක්පොත ගමේ පිහිටි මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6733 හා 2018.02.22 දිනැති පිඹුරේ කැබලි අංක 02 සහ 03 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.6135 ක්වූ දෝතුළුකන්ද නැමැති ඉඩම්.

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: දෝතුළුකන්ද; ඉඩමේ විස්තර: කැලය; හිමිකම් කියන අය: රඹුක්පොත මැදමහනුවර පදිංචි එච්. එම්. ඩබ්. ජී. ටී. බී. හේරත් ඒකනායක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2835.

02. **කැබලි අංක 03**

ඉඩමේ නම: දෝතුළුකන්ද; ඉඩමේ විස්තර: කැලය; හිමිකම් කියන අය: රඹුක්පොත මැදමහනුවර පදිංචි එච්. එම්. ඩබ්. ජී. ටී. බී. හේරත් ඒකනායක; ප්‍රමාණය: හෙක්ටයාර් 2.3300.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019.04.03 වැනි දින පෙ. ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019.03.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2019 ජනවාරි මස 14 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

02 - 143

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29280 - 17 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.